# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

**10 ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය**

නම/ විභාග අංකයඃ ........................................ කාලය : පැය 03 යි

**I පත්‍රය**

උපදෙස්

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති i, ii ,iii, iv යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

1) බෝසත් චරිතයෙන් පැහැදිලි වන සාර්ථක ජීවිතයක් සඳහා පදනම සකස් කරගත යුතු ආකාරය දැක්වෙන අවස්ථාව වන්නේ,

i. සත්පියුම් මත පියවර තැබීමයි ii. පංචමහා විලෝකනය යි
iii. සිහනාද පැවැත්වීමයි iv. ශිල්ප හැදෑරීමයි

2) සතර පෙරනිමිති වලින් සිදුහත් කුමරුට පැවිදිවීමේ අභිලාශය ඇතිවූයේ කවර නිමිත්ත දැකීමෙන් ද?

i. නිබ්බුත පද ඇසීම ii. සතර පෙරනිමිති දැකීම
iii. රාහුල කුමරුගේ උපත iv. පැවිදි රුවක් දැකීම

3) සිදුහත් කුමරුට අභියෝග ජයගැනීමට උපකාර වූ ගුණාංගයක් නොවන්නේ,

i. අධිෂ්ඨානයයි ii. නිවැරදි ඉරියව්වෙන් ගමන් කිරීමයි
iii. ශිල්ප හැදෑරීමයි iv. කැප වීමයි

4) මහා සංඝරත්නය වෙතින් සිදුවන සමාජ සේවයක් නොවන්නේ,

i. මංමාවත් ඉදිකිරීම ii. වැව් හා ඇළවේළි පිළිසකර කරවීම
iii. ජීවිතයේ සුභ අවස්ථාවන් වලදී ආශිර්වාද කිරීම iv. ගමේ සමිති සමාගම් වලට අනුශාසනා කිරීම

5) "රහසත් පව් නොකොට" යන කවිය ඇතුළත් සාහිත්‍ය ග්‍රන්ථය,

i. ලෝවැඩ සඟරාව යි ii. ලෝකෝපකාරය යි
iii. බුදුගුණ අලංකාරය යි iv. සුභාෂිතය යි

6) තමා විසින් ම පිළිපැඳ ඇස් පනාපිට මෙලොවදී ම ප්‍රතිඵල දැන ගත හැකි බැවින් ධර්මය,

i. ස්වාක්ඛාත වේ ii. සන්දිට්ඨික වේ
iii. අකාලික වේ iv. ඒහි පස්සික වේ

7) ආගන්තුකයින්ට සූදානම් කරන ලද ප්‍රත්‍යයෙන් සංග්‍රහ කිරීමට හැකි නිසා සංඝරත්නය,

i. ආහුනෙය්‍ය ගුණයෙන් යුක්ත ය ii. පාහුනෙය්‍ය ගුණයෙන් යුක්ත ය
iii. දක්ඛිණෙය්‍ය ගුණයෙන් යුක්ත ය iv. අංජලිකරණීය ගුණයෙන් යුක්ත ය

8) බුදු දහමේ බොර ජලයට උපමාකොට ඇත්තේ කුමන නිවරණය ද?

i. කාමච්ඡන්දය ii. විචිකිච්ඡාය
iii. ව්‍යාපාදය iv. උද්ධච්ච කුක්කුච්ච

9) භාවනාවට පිවිසෙන තැනැත්තෙකු විසින් ඉටුකර ගත යුතු පූර්ව අවශ්‍යතාවක් නොවන්නේ,
- i. විනිවිද දකින නුවණ ඇතිකරගැනීම ය
- ii. කය,වචනය දෙකෙහි සංවර බව ඇතිකර ගැනීමය
- iii. යහපතෙන් දුරස් කරන මිතුරන් ඇසුරු කිරීම ය
- iv. නිතර නිතර ධර්මය ඇසීම ය

10) සමථ භාවනාවෙන් දෛනික ජීවිතයට ලැබිය නොහැකි ප්‍රයෝජනයක් වන්නේ,
- i. සිත එකඟ කරගැනීමයි
- ii. නිවන අවබෝධ වීමයි
- iii. අසහනය නැකි වීමයි
- iv. කෙලෙස් සිතිවිලි පාලනය කිරීමයි

11) "ගෞතමයන් වහන්ස, ඇතුළත අවුල් ය.පිටත ද අවුල් ය.සත්ත්ව ප්‍රජාව අවුලෙන් වෙලී සිටියි. කවරෙක් නම් මේ අවුල් නිරවුල් කරන්නේ ද? "මෙම ප්‍රශ්නය ඇසුවේ,
- i. සුදත්ත සිටුවරයා විසින් ය
- ii. කොසොල් රජතුමා විසින් ය
- iii. දෙවි කෙනෙකු විසින් ය
- iv. සුභ මානවකයා විසින් ය

12) ඇත්ත ඇති සැටියෙන් දැකීමේ නුවණ බුදු දහමේ හඳුන්වා ඇත්තේ,
- i. සඤ්ඤා ලෙස ය
- ii. විඤ්ඤා ලෙස ය
- iii. පඤ්ඤා ලෙස ය
- iv. අඤ්ඤා ලෙස ය

13) විඤ්ඤාණ ස්කන්ධය බෙදෙන ආකාර කීය ද?
- i. 3 කි
- ii. 4 කි
- iii. 5 කි
- iv. 6 කි

14) වැලිවිට ශ්‍රී සරණංකර නා හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමීම සිදුකලේ,
- i. ශ්‍රී විජය රාජසිංහ රජු ය
- ii. කීර්ති ශ්‍රී රාජසිංහ රජු ය
- iii. රාජාධි රාජසිංහ රජු ය
- iv. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ය

15) දුටු ගැමුණු මහරජතුමා සිදු කළ ජාතික සේවාවක් වන්නේ,
- i. ලෝවාමහා ප්‍රාසාදය කරවීම
- ii. මහා විහාරය අංග සම්පූර්ණ කිරීමය
- iii. සූවිසි වසරක් වෙසක් උත්සව පැවැත්වීමය
- iv. ගිලන් හල් සේවාවක් ආරම්භ කිරීමය

16) "උට්ඨානවතෝ සතිමතෝ ... " යන ගාථාවෙහි සිත විමසා කටයුතු කිරීම යන අදහස දෙන වචනය වන්නේ,
- i. "සතිමතෝ" යන වචනයයි
- ii. "සුචිකම්ම" යන වචනයයි
- iii. "නිස්සම්මකාරි" යන වචනයයි
- iv. "සඤ්ඤත" යන වචනයයි

17) දිය සිඳී ගිය පොකුණක් සමීපයේ පසුතැවෙන මහලු කොස්වා ලිහිණියා පසුතැවෙන්නේ කුමක් නිසා ද?
- i. පොකුණේ දිය සිඳී ඇති නිසා
- ii. පොකුණේ මාළුවන් නැති නිසා
- iii. පොකුණේ ජලය යළි පිරෙන තෙක් තමා ජීවත් නොවන නිසා
- iv. ජලය හා මාළුන් ඇති කළ පැමිණීමට නොහැකි වූ නිසා

18) සිඟාලෝවාද සූත්‍රයට අනුව බෝග විනාශයට හේතුවන කරුණක් නොවන්නේ,
- i. අලසකමය
- ii. මධ්‍යසාර ගැනීමය
- iii. මිතුරන් ඇසුරු කිරීමය
- iv. සූදුවෙහි යෙදීමය

19) සිල්වත් පුද්ගලයා සමාජයට යහපතක් මිස අයහපතක් නොකරන බැවින් සමාජය ඔහු ප්‍රියකරයි. ඒ නිසා ඔහු,
- i. මිතුරන් ඇසුරු කරයි.
- ii. ධන සම්පත් ඇත්තෙකු වෙයි.
- iii. ඕනෑම පිරිසක් මධ්‍යයට නොබියව එළඹෙයි.
- iv. බහුශ්‍රැතයෙක් වෙයි.

20) "යෝ වේ වස්සසතං ජීවේ....... " යන ගාථාව ඇතුළත් වන්නේ,
- i. යමක වග්ගයට
- ii. චිත්ත වග්ගයට
- iii. සහස්ස වග්ගයට
- iv. අත්ත වග්ගයට

21) සිඟාලෝවාද සූත්‍රයේ යහළු - මිත්‍ර සබඳතා තුළ දක්නට ලැබෙන යුතුකමක් වන්නේ,
- i. අවශ්‍ය කටයුතු ඉටු කර දීමය
- ii. අවමන් නොකිරීමය
- iii. මිහිරි ආහාර ආදිය නිසිලෙස බෙදා දීමය
- iv. ප්‍රිය වචනයෙන් කතා කිරීමය

22) අකුසල් කරන්නවුන් අතර කුසල් කරන්නෙකු වීම හා පව්කම් කරන්නවුන් අතර පිංකම් කරන්නෙකු වීම,

i. සල්ලේඛ ප්‍රතිපදාව අනුගමනය කිරීමකි
ii. අනුසෝතගාමි ප්‍රතිපදාව අනුගමනය කිරීමකි
iii. පද්මාකාර ජීවිතය අනුගමනය කිරීමකි
iv. මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීමකි

23) සිඟාලෝවාද සූත්‍රයට අනුව පැවිදි පක්ෂය විසින් ඉටුකළ යුතු යුතුකමක් නොවන්නේ ගිහියා ,

i. පවින් වැළැක්වීමයි
ii. මැනවින් හික්මවීමයි
iii. යහපත් ක්‍රියාවල යෙදවීමයි
iv. යහපත් සිතින් අනුකම්පා කිරීමයි

24) දෙමව්පියන් හැඳින්වීම සඳහා සුදුසු නොවන පදයක් වන්නේ,

i. පුබ්බදේව ය
ii. පුබ්බාචරිය ය
iii. බ්‍රහ්ම ය
iv. අර්ථචර්යා ය

25) අන්‍ය ආගම් හා ජාතීන් සමඟ සහජීවනයෙන් වාසය කිරීම සඳහා බුදු දහමේ දැක්වෙන ඉගැන්වීමක් නොවන්නේ,

i. පංච සීලයයි
ii. සිවු සඟරාවතයි
iii. සතර අගතියයි
iv. සතර බ්‍රහ්ම විහරණයි

26) "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි " යන පාලි පාඨයේ අදහස නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න,

i. චේතනාව නිසා කර්මය සිදුවෙන බව කියයි
ii. මහණෙනි මම කර්මයට චේතනාව මුල්වන බව කියමි
iii. මහණෙනි මම චේතනාවට කර්මය හේතුවන බව කියමි
iv. මහණෙනි මම චේතනාව කර්මය යැයි කියමි

27) විපාක දෙන කාලය අනුව ප්‍රවෘත්ති විපාක ලැබෙන හා ප්‍රතිසන්ධි විපාක නොලැබෙන කුසලාකුසල කර්ම වන්නේ,

i. දිට්ඨධම්මවේදනීය කර්මය
ii. උපපජ්ජවේදනීය කර්මය
iii. අපරාපරියවේදනීය කර්මය
iv. අහෝසි කර්මය

28) විපාක දෙන ආකාරය අනුව දෛනිකව සිදු කරන සිල් රැකීම ,භාවනා කිරීම ,සොරකම , සත්ත්ව ඝාතනය වැනි කුසලාකුසල කර්ම ,

i. ගරුක කර්ම ලෙස හැඳින්වේ
ii. ආචින්න කර්ම ලෙස හැඳින්වේ
iii. ආසන්න කර්ම ලෙස හැඳින්වේ
iv. කටත්තා කර්ම ලෙස හැඳින්වේ

29) සැප සහිත වූ දිව්‍ය භවය උපත ලැබූ අයෙකුට එම දිව්‍ය භවය තුළ තවදුරටත් සැපවත්ව විසීමට හේතු වන කර්ම වන්නේ,

i. ජනක කුසල කර්මයයි
ii. උපඝාතක අකුසල කර්මයයි
iii. උපපීඩක කුසල කර්මයයි
iv. උපත්ථම්භක කුසල කර්මයයි

30) සැප සම්පතින් පිරුණු පවුලක උපත ලැබූ අයෙකුට පෙර භවයන් වල සිදුකළ අකුසල කර්ම විපාක දීම වැළකී යාම ,

i. ගතිසම්පත්තිය ලෙස හැඳින්වේ
ii. උපධිසම්පත්තිය ලෙස හැඳින්වේ
iii. කාලසම්පත්තිය ලෙස හැඳින්වේ
iv. ප්‍රයෝග ලෙස හැඳින්වේ

31) දස අකුසල ධර්මයන්ට අනුව ''තරහව'' හඳුන්වා ඇත්තේ,

i. අභිද්‍යාව ලෙසය
ii. ක්‍රෝධය ලෙසය
iii. ව්‍යාපාදය ලෙසය
iv. දෝසය ලෙසය

32) ත්‍රිලක්ෂණය ඉගැන්වීමට අනුව බුදුදහමේ ''ලෝක'' යනුවෙන් හැඳින්වෙන්නේ,

i. දුක ඇති කරන ස්වභාවයයි
ii. කැඩෙන බිඳෙන සුළු ස්වභාවයයි
iii. නාම ධර්ම පද්ධතියයි
iv. රූප ධර්ම පද්ධතියයි

33) තිලකුණු දහමට අනුව ලෝකය පිහිටා ඇත්තේ,

i. කර්මය මතය
ii. සැප මතය
iii. නියාම ධර්ම මතය
iv. දුක මතය

34) නිත්‍ය වූත් ස්ථිර වූත් නොවෙනස්ව පවතින පදාර්ථයක් ඇති බව ඉගැන්වීම,

i. ආත්ම වාදයකි
ii. අනාත්ම වාදයකි
iii. නියති වාදයකි
iv. භෞතික වාදයකි

35) ත්‍රිලක්ෂණ අවබෝධය ඇති තැනැත්තා තුළ දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,

i. අල්පේච්ඡ බවයි
ii. කම්පිත බවයි
iii. මධ්‍යස්ථ බවයි
iv. ලද දෙයින් සතුටු වන බවයි

36) ''අනිච්ඡාවත සංඛාරා'' යන ගාථාව ඇතුළත් සූත්‍ර දේශනාව වන්නේ,

i. සිඟාලෝවාද සූත්‍රයයි
ii. දම්සක් පැවතුම් සූත්‍රයයි
iii. පරිණිබ්බාන සූත්‍රයයි
iv. චක්කවත්ති සීහනාද සූත්‍රයයි

37) හේතු නිසා හටගත් දෙය හේතු නැතිවන විට නැතිව යන බව පැවසෙන පාලි පාඨය වන්නේ,

i. යේධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ
ii. හේතුං පටිච්ඡ සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති
iii. ඉමස්මිං අසති ඉදං නහෝති - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති
iv. ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්ස උප්පාධා ඉදං උපපජ්ඣති

38) දුක ඇති වීමට ප්‍රධාන හේතුව තෘෂ්ණාව බව දැක්වෙන ආර්ය සත්‍යය වන්නේ,

i. දුක්ඛ නිරෝධාර්ය සත්‍යයයි
ii. දුක්ඛ ආර්ය සත්‍යයයි
iii. දුක්ඛ සමුදය ආර්ය සත්‍යයයි
iv. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යයයි

39) චතුරාර්ය සත්‍යය තුළ පැහැදිලි කෙරෙන ''දුක්ඛ'' යන බුද්ධ වචනයෙහි ගැඹුරු තේරුම වන්නේ,

i. කනගාටුවයි
ii. අසන්තෝෂයයි
iii. අසාර බවය
iv. ඇඬීමයි

40) සම්මා වායාම මාර්ගාංගයේ 'උත්සාහය' සතර ආකාර වේ. එම සතර ආකාරවලට අයත් නොවන්නේ.

i. නූපන් අකුසල් නූපදවීම ය
ii. උපන් කුසල් නැති කිරීම ය
iii. නූපන් කුසල් උපදවීම ය
iv. උපන් කුසල් දියුණු කිරීම ය

(ලකුණු 1× 40 =40)

**II පත්‍රය**

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

1)

i. සිදුහත් බෝසත් උපතේ දී සිදු වූ ආශ්චර්යවත් සිදුවීම් දෙකක් නම් කරන්න.

ii. '' ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනේ ....'' මෙම ගාථාවේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

iii. සඟ ගුණ අතරින් දෙකක් නම් කරන්න.

iv. සම්මා වාචා මාර්ගාංගය කොටස් හතරකි, ඉන් දෙකක් දක්වන්න.

v. වැලිවිට අසරණ සරණ සරණංකර හිමිගේ ශාසනික සේවාවන් දෙකක් ලියන්න.

vi. "ඉමස්සඋප්පාදා ඉදං උප්පජ්ජති" යන්නෙහි අදහස ලියන්න.

vii. ''විසේසේන පස්සතීති විපස්සනා ....'' යන්නෙහි තේරුම ලියන්න.

viii. දුටුගැමුණු රජුගේ ශාසනික සේවාවන් දෙකක් ලියන්න.

ix. චතුරාර්ය සත්‍ය අතරින් දෙකක් ලියන්න.

x. මැදුම් පිළිවෙතට පිවිසීමේදී අත්හළ යුතු අන්ත දෙක නම් කරන්න. (ලකුණු 2 ×10=20)

2)

i. සිදුහත් කුමරුන් මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න. (ල.2)

ii. ඉහත නම් කරන ලද එක් අභියෝගයක් කෙටියෙන් විස්තර කරන්න. (ල.3)

iii. සිදුහත් කුමරුගේ ළමාකාලය ඇසුරින් ඔබේ ශිෂ්‍ය ජීවිතය සාර්ථක කරගත හැකි ආකාරය පහදන්න. (ල.5)

3)

i. බෞද්ධ භාවනාවේ ප්‍රභේද දෙක නම් කරන්න. (ල.2)

ii. භාවනාව සඳහා යොමුවන පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංග තුන නම් කරන්න. (ල.3)

iii. භාවනාව තුළින් ශිෂ්‍ය ජීවිතයට ලැබෙන ප්‍රයෝජන කවරේදැයි විස්තර කරන්න. (ල.5)

4)

i. ''අචරිත්වා බ්‍රහ්ම චරියං .....'' යන ගාථාව සම්පූර්ණ කරන්න. (ල.2)

ii. ඉහත සම්පූර්ණ කළ ගාථාවේ සරල අදහස ලියන්න. (ල.3)

iii. පසුතැවිලි නොවන ජීවිතයක් ගත කිරීමට ධම්ම පදයෙන් ලැබෙන උපදෙස් අගය කරන්න. (ල.5)

5)

i. බුදු දහමේ ඉගැන්වෙන ''ශීලය'' යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල.2)

ii. සිල් රැකීමේ ආනිසංස තුනක් ලියන්න. (ල.3)

iii. ''සිල්වත් වීම මහත් භෝග සම්පත් ලැබීමට උපකාරයකි '' පැහැදිලි කරන්න. (ල.5)

6)

i. ''අනුසෝතගාමී'' යන්නෙහි අර්ථය ලියන්න. (ල.2)

ii. බුදු දහමේ ''නෙළුම'' උපමා කොටගෙන දක්වන ලද පෞරුෂත්ව වර්ග තුන නම් කරන්න. (ල.3)

iii. වැරදි බහුල සමාජයක නිවැරදි යහපත් ජීවිතයක් ගත කළ හැකි ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල.5)

7) පහත සඳහන් මාතෘකා අතරින් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

i. මව්පිය - දූදරු සබඳතා

ii. සතර සංග්‍රහ වස්තු

iii. දුටුගැමුණු රජතුමා

iv. අනිත්‍ය ලක්ෂණය (ල. 5× 2= 10 )